**ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2023**

------------------------------------------------------------------------

ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2015 නොවැම්බර් 06 දින එළඹි අංක 5685 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II උපලේඛනයේ II ඡේදයේ (ඇ) (3) හා 2010 ජූලි 31 දින එළඹි ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය හා ප්‍රදාන සාමාන්‍ය කොන්දේසිවල 4.09 (ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන අමාත්‍යාංශය සහ වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තෝරාගත් දිස්ත්‍රික්කවල නල ජල සේවා හා වැඩිදියුණු කළ සනීපාරක්ෂක සේවා සඳහා ප්‍රවේශය වැඩිකිරීම සහ සම්බන්ධිත ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. නාගරික, ග්‍රාමීය හා වතු ජල සම්පාදන හා සනීපාරක්ෂක යෝජනා ක්‍රම පුනරුත්ථාපනය කිරීම හා පුළුල් කිරීම, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුවේ ධාරිතාවය ශක්තිමත් කිරීම, පුහුණුව ලබාදීම මඟින් ආංශික ධාරිතාවය ගොඩ නැංවීම හා ජලයේ ගුණත්වය සැලසුම්කරණය සහ ව්‍යාපෘති කළමනාකරණය හා පරිපාලනය යන සංරචක 04 ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 27,590 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 183.90 ක් වන අතර ඉන් රු.මිලියන 24,750 කට සමාන එ.ජ.ඩො මිලියන 165 ක් මූල්‍යනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 2,840 ක් ශ්‍රී ලංකා රජය හා ප්‍රජා දායකත්වය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 ඡේදයේහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩු ද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| අ | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව 2023 දෙසැම්බර් 27 දින ලද සෘජු ගෙවීමකට අදාළ එ.ජ.ඩො 78,523 ට සමාන රු. මිලියන 26 ක් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. එබැවින්, ලෝක බැංකු ණය මුදල සහ කෙරීගෙන යන වැඩ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 26 | 2024 ජනවාරි මාසයේදී රු. මිලියන 26 ක මුදල භාණ්ඩාගාරයෙන් තහවුරු කර ඇත. මෙය වැරදීමකින් 2024 මූල්‍ය වර්ෂයේ ගිණුම් පද්ධතියට ඇතුලත් කර ඇත. | සියලුම ණය ලැබීම් ගනුදෙනු සිදු වූ අවස්ථාවේ දී සටහන් කළ යුතුය. |
| ආ | ලෝක බැංකු අත්තිකාරම් ගිණුමට අදාළ ප්‍රත්‍යාගණන ලාභය ලෝක බැංකු අත්තිකාරම් ගිණුමට ගැලපීම වෙනුවට වෙනත් ප්‍රත්‍යාගණන ලාභ ගිණුමකට ගලපා තිබුණි. එබැවින්, රු. මිලියන 1,785 ක් වූ ලෝක බැංකු අත්තිකාරම් මුදල ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස ඉදිරිපත් කර තිබුණි. | 1,785 | සෑම මසකම අවසානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඩොලරයේ අගය නැවත ඇගයීම කරනු ලබන අතර එහි වටිනාකම මහ බැංකු මුදල් පොතට සහ ප්‍රත්‍යාගණන ලාභ හෝ අලාභ ගිණුමට සටහන් කරනු ලබයි. ව්‍යාපෘතියේ වියදම් දැරීමේදී රුපියලේ අගය පමණක් අදාළ වන බැවින් ප්‍රත්‍යාගණනය ලාභය වියදමක් විය හැක. එබැවින්, ලෝක බැංකු ශේෂය හර ශේෂයක් ලෙස පෙන්වයි. ව්‍යාපෘතිය අවසන් වූ පසු, අපි අවසන් ගිණුම්වල අදාළ ගැලපීම සිදු කරනු ඇත. | ප්‍රත්‍යාගණන ලාභය ලෝක බැංකු අත්තිකාරම් ගිණුමට නිවැරදිව හඳුනාගත යුතුය. |
| ඇ | පෙර වසරවල ණය සඳහා කරන ලද පොලිය නිවැරදි කිරීම සඳහා යොදා තිබූ රු. මිලියන 110 ක ජ'නල් සටහනක් සහ රු. මිලියන 9,068 ක විනිමය අනුපාත ලාභයක්, ඒවා ව්‍යාපෘතියට ලද තත්‍ය මුදල් ප්‍රවාහයන් නොවූනත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ලෙස ඉදිරිපත් කර තිබුණි. | 110 | රු. මිලියන 110 යනු පෙර වර්ෂයේ ගැලපීමකි. 2023 මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස රු.මිලියන 9,068 පෙන්වයි. | සෘජු ක්‍රමය මත පදනම්ව සකස් කරන ලද මුදල් ප්‍රවාහවලට මුදල් නොවන අයිතම ඇතුළත් නොකළ යුතුය. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘති කටයුතුවල භෞතික ප්‍රගතිය

| සංරචකය | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම තිස් අටක්, ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති, පොදු සනීපාරක්ෂක, ස්වදේශික සනීපාරක්ෂක හා පාසල් සනීපාරක්ෂක ව්‍යාපෘති | අවස්ථා 01 සිට 07 දක්වා දීර්ඝ කිරීම් ලබා දීමෙන් පසුව පවා ව්‍යාපෘති තිස් අටකට අදාළව දින 330 සිට දින 2,158 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කාලසීමාව නිසි ලෙස සැලසුම් නොකිරීම, කොන්ත්‍රාත්කරුවන් කිහිප දෙනෙකුගේ දුර්වල ක්‍රියාකාරීත්වය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, කොවිඩ් 19 වසංගතය, ආර්ථික අර්බුදය යනාදිය ප්‍රමාදයට බලපා ඇත. | එම උප ව්‍යාපෘති සියල්ලම පාහේ මේ වන විට සැලකිය යුතු ලෙස නිම කර ඇත.<br><br>එසේවුවද, ආරම්භයේ දී ඉහත උප ව්‍යාපෘති සතුටුදායක ලෙස ක්‍රියාත්මක විය.<br><br>ඉදිකිරීම් කර්මාන්තයේ කොන්ත්‍රාත්කරුවන්ට සහාය වීම සඳහා රජය යම් යම් ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. තවමත් සිදු වූ ප්‍රමාදයන් සම්පූර්ණයෙන්ම වළක්වා ගත නොහැකි විය. එවැනි තත්ත්වයන් යටතේ, එවැනි දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට සහාය වීම සඳහා ව්‍යාපෘතියට සුදුසු පරිදි කාලය දීර්ඝ කිරීමට සිදු විය. | අපේක්ෂිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කළ යුතුය. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| අ | තුළුමුව (Intake) සහ ගබඩා ටැංකිය අතර නල එළීම සඳහා ප්‍රජා මූල සංවිධානයේ දායකත්වය ලබාදී නොතිබීම හේතුවෙන් කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක අදියර 02 ප්‍රතිසංස්කරණ ව්‍යාපෘයේ ඉදිකිරීමේ කටයුතු 2024 ජනවාරි මාසය වනතුරු අවසන් කර නොතිබුණි. | දැන් ප්‍රජා මූල සංවිධානය විසින් වැඩ නිම කර ඇත. | අපේක්ෂිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කළ යුතුය. |
| ආ | කොටියාකුඹුර ව්‍යාපෘතියේ වැලි පෙරන ටැංකිය මෙහෙයුම් සඳහා භාවිත නොකිරීම නිසා දරන ලද රු. මිලියන 1.7 ක පිරිවැය අනාර්ථික විය. | පෙරහන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ප්‍රජා මූල සංවිධාන (ප්‍ර.මූ.ස) සමඟ සාකච්ඡා කරන අතර වැලි පෙරහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමතර කාර්යයන් සඳහා ප්‍රජා දායකත්වය භාවිතා කළ යුතුය. | පිරිසිදු ජලය බෙදා හැරීම සඳහා වැලි පෙරහන භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඇ | රටේ ආර්ථික තත්ත්වය මත ද්‍රව්‍යවල මිල ඉහළ යාමත් සමඟ එක් කොන්ත්‍රාත්කරුවෙකු කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ඩී.එස්.ඩී සහ දැරණියගල ඩී.එස්.ඩී හි ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති දෙක ප්‍රතිසංස්කරණය කිරීම අත්හැර දමා තිබුණි. එබැවින්, මෙම කොන්ත්‍රාත් දෙක සඳහා දරන ලද පිරිවැය ඵලදායී නොවනු ඇත. | කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල ඉහළ මිල ගණන් නිසා විෂය පථය අඩු විය. | වැය කරන ලද පිරිවැය ප්‍රයෝජනයට ගැනීමට කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කළ යුතුයි. |
| ඈ | උපරිම ජල සනත්වය පී.පී.එම් 250 ක් විය යුතු වුවත් ජල සනත්වය පී.පී.එම් 1,805 ක් වීම නිසා 2019 දී නිම කරන ලද රු. මිලියන 26 ක් වටිනා ජල සම්බන්ධතා 250 කට ජලය බෙදාහරින රිදීමාලියද්ද ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම ජල යෝජනා ක්‍රමය වසර තුනකට වැඩි කාලයක් ප්‍රජාව විසින් ක්‍රියාත්මක කර ඇත. දැන් ජලයේ සනත්වය ස්භාවිකවම වැඩි වී ඇත. එසේම, ප්‍රධාන මාර්ගය ඔස්සේ, ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ (මණ්ඩලය) නළ මාර්ග දැන් ක්‍රියාත්මක වේ. එබැවින්, ප්‍ර.මූ.ස නල පද්ධතිය මණ්ඩලයේ නල පද්ධතියට සම්බන්ධ කරන ලෙස සහ ප්‍ර.මූ.ස පවරා ගන්නා ලෙස ප්‍රජාව විසින් මණ්ඩලයෙන් ඉල්ලා ඇත. මණ්ඩලයේ ඌව ප්‍රා.ස.ම විසින් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටින අතර මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මණ්ඩලය විසින් ප්‍ර.මූ.ස පද්ධතිය පවරා ගනු ඇත. | ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත පද්ධතිය භාරදීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම. |
| ඉ | පිළිගත හැකි හේතුවක් නොමැතිව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 ඡේදයට පටහැනිව රු. මිලියන 599 ක් වූ කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රසම්පාදනය අනු සංරචකවලට බෙදා තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ තීරණාත්මක මාර්ගය සැලකිල්ලට නොගැනීම නිසා ව්‍යාපෘතියේ සමහර සංරචක අනෙකුත් අවශ්‍ය සංරචක සම්පූර්ණ කිරීමට පෙර නිම කර ඇති බැවින් සමහර වත්කම් භාවිතයට පෙර හානි වනු ඇත. | ලෝක බැංකුව අරමුදල් සපයන මෙම ව්‍යාපෘතිය යටතේ කෙටි කාලසීමාවක් තුළ උප ව්‍යාපෘති නිම කිරීම අනිවාර්ය වූ බැවින්, ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා කිලිනොච්චි ජල යෝජනා ක්‍රමයට අදාළ සැලසුම් අදියර වශයෙන් සිදු කර ඇත. සැලකිය යුතු විශාලත්වයකින් යුත් යම් කොටසක සැලසුම් අවසන් වූ විට, අදාළ පැකේජය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ විය. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අනුකොටස් කිරීම සහ කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සොයා ගැනීමට විමර්ශනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඊ | ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 වැනි දින අවසන් කිරීමට අපේක්ෂිත වූ අතර එදින සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළද, නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වූ අතර ව්‍යාපෘති කාලය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, එ.ජ.ඩො.මිලියන 18 ට සමාන රු. මිලියන 5,080 ක ණය ආපසු ගෙවීමක් 2020 වසරේ සිට මහා භාණ්ඩාගාරය විසින් සිදු කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | මුල් ව්‍යාපෘතියේ අවසන් අදියරේදී අනපේක්ෂිත කොවිඩ්19 වසංගතය, ආර්ථික අර්බුදය සහ ආනයන සීමා කිරීම් සිදු විය. ඉහත හේතූන් මත ව්‍යාපෘති කාලය දීර්ඝ කර ඇත. අතිරේක මූල්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කාලය 2023.12.31 දක්වා දීර්ඝ කර ඇත. | ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාව ඉටු කිරීම සඳහා ව්‍යාපෘති කටයුතු කඩිනම් කළ යුතුය. |
| උ | ව්‍යාපෘති ඇගයීම් ලේඛනවල 38 වැනි වගන්තියේ අවශ්‍යතාවයට අනුව, ග්‍රාමීය ජල සම්පාදන නව ව්‍යාපෘති සහ ග්‍රාමීය ජල සම්පාදන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවලට අදාළව රු. මිලියන 551 ක ප්‍රජා දායකත්වය ලබාගෙන හෝ වාර්තා කර නොතිබුණි. භෞතික පරීක්ෂාවේදී මලයාලපුරම් ප්‍රදේශයේ නළ එලීම සඳහා රු. මිලියන 52 ක ප්‍රජා දායකත්වය ලබාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | උතුරු පළාතේ නැවත පදිංචි කිරීමේ ජනතාවගේ ගැටළු සලකා බලමින් කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවල ප්‍රජා දායකත්වය ඉවත් කර ඇත. | විශේෂ හේතූන් නොමැති විට ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ කොන්දේසිවලට අනුකූල විය යුතුය. |
| ඌ | කොන්ත්‍රාත් ලේඛනවල කොන්දේසි අංක 43 ට පටහැනිව, ව්‍යාපෘතිය විසින් කිලිනොච්චි දිස්ත්‍රික් ව්‍යාපෘති සඳහා සෘජුවම උප කොන්ත්‍රාත්කරුවන් දාහතර දෙනෙකුට රු. මිලියන 19 ක් ගෙවා තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසිවල 8.1 උප වගන්තිය අනුව, සේවා යෝජකයාට උප කොන්ත්‍රාත්කරුවන්ට සෘජුවම ගෙවීමේ හැකියාව වළක්වා නොමැත. 43 වගන්තියේ උප කොන්ත්‍රාත්කරුවන්ට කිසියම් ගෙවීමක් පිළිබඳව සඳහන් කර නොමැති බවට එකඟ වන නමුත් එහි කොන්ත්‍රාත්කරුවන් පිළිබඳව සඳහන් කරයි.<br><br>විගණන වාර්තාවේ සඳහන් කර ඇති උප කොන්ත්‍රාත්තු කිහිපයකට අදාළව, ව්‍යාපෘතිය විසින් උප කොන්ත්‍රාත්කරුට/කරුවන් වෙත සෘජුවම ගෙවීම් කිරීමට එකඟ වී ඇත, නමුත් ප්‍රධාන කොන්ත්‍රාත්කරුගේ ක්‍රියාකාරකම්වල තීරණාත්මක මාවතට බලපෑමක් නොවන බවට උප කොන්ත්‍රාත්කරුගේ/ කරුවන්ගේ ක්‍රියාකාරීත්වය සහතික කර ගැනීම සඳහා වන සුවිශේෂී අවස්ථාවක් ලෙස නිර්දේශය මත එය සිදු කරයි. | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කරන විට, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුගමනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| එ | කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසිවලට අනුව, කොන්ත්‍රාත් අවසන් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රතීක (Septage) පවිත්‍රාගාරයට අදාළව රු. මිලියන 84 ක සහ පරන්තන් හින්දු විද්‍යාලයේ පාසල් සනීපාරක්ෂක ව්‍යාපෘතියට අදාළව රු. මිලියන 2.3 ක ඇවර කළ අලාභ ව්‍යාපෘතිය විසින් අයකර ගෙන නොතිබුණි. | කිලිනොච්චිය ප්‍රාදේශිය සභා කසල බැහැර කරන පරිශ්‍රයේ ප්‍රතීක පවිත්‍රාගාරය ඉදි කර ඇත. එබැවින්, විවිධ බාධා කිරීම් හේතුවෙන් වරින් වර වැඩ බිම වසා දැමුණු අතර අධික වර්ෂා සහිත කාලවලදී, ප්‍රතීක පවිත්‍රාගාරයේ ප්‍රවේශ මාර්ගය සම්පූර්ණයෙන්ම ජලයෙන් යටවී ගංවතුර මට්ටම යම් දින ගණන් පවතී.<br><br>ඉහළ භූගත ජල මට්ටම පරන්තන් හින්දු විද්‍යාලයේ පූතික (Septic) ටැංකිය ඉදිකිරීමේ ප්‍රමාදයට බලපා ඇත. එබැවින්, ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට කාල දීගුවක් ලබා දී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූල විය යුතු අතර කොන්ත්‍රාත් කොන්දේසි කඩ කළ අය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| ඒ | මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතියේ රු. මිලියන 695 ක් වූ සමස්ත වැඩවලින් රු. මිලියන 236 ක් හෙවත් සමස්ත ව්‍යාපෘති වටිනාකමෙන් සියයට 33.91 ක් ව්‍යාපෘතිය විසින් මග හැර තිබුණි. ව්‍යාපෘති විෂය පථය විශාල ලෙස වෙනස් වී ඇතත් නව ප්‍රසම්පාදනයකට නොගොස් අමතර වැඩ ඇණවුම් සඳහා රු. මිලියන 29 ක් සහ විශේෂ අනුපාත ලේඛණගත වැඩ සඳහා රු. මිලියන 238 ක් ව්‍යාපෘති පිරිවැයට එකතු කර තිබුණි. | මුලන්කාවිල් ව්‍යාපෘතියේ සංකීර්ණ ස්වභාවය සහ වැඩ බිම් තත්ත්වය සහ වෙනත් හේතුන් සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය සතුටුදායක ලෙස නිම කිරීම සඳහා අවශ්‍ය පරිදි සැලකිය යුතු වෙනස්කම් හඳුන්වා දීමට සිදු විය. ඇතැම් වැඩ ප්‍රමානවල (BOQ) ඇතුළත් අයිතමවල ප්‍රමාණය ඉක්මවීම හේතුවෙන් අමතර වැඩ ඇණවුම් ඇති වේ. අනෙක් අතට, ඕනෑම වැඩ ප්‍රමානවල අයිතමයක විෂය පථය හෝ පිරිවිතර වෙනස් වීම හේතුවෙන් විශේෂ අනුපාත ලේඛණගත වැඩ ඇති වේ. සාමාන්‍යයෙන් විශේෂ අනුපාත ලේඛණගත වැඩ ඇති විට, එහි ප්‍රතිඵලයක් ලෙස මගහැරීමක් සිදු වනු ඇත. | අනවශ්‍ය විචලනයන් සහ පිරිවැය වළක්වා ගැනීම සඳහා සැලැස්ම සහ ඇස්තමේන්තුව සැකසීමට පෙර ශක්‍යතා අධ්‍යයනය කළ යුතුය. |
| ඔ | ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති කාර්ය සාධන වාර්තාවට අනුව, අතුරු ගෙවීම් සහතික අනුමත කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරු විසින් අතුරු ගෙවීම් සහතික ඉදිරිපත් කිරීම හා විචලන විධාන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රු. මිලියන 2,340 ක් වටිනා භෞතික වශයෙන් නිම කරන ලද ව්‍යාපෘති පහළොවක මූල්‍ය ප්‍රගතිය සියයට 0 සිට 66 දක්වා පරාසයක පවතී. | කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය වෙත ගෙවීම් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සහ පාලනය කළ නොහැකි හේතූන් මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් අතුරු ගෙවීම් සහතික නිකුත් කිරීමේදී ප්‍රමාදයන් සිදු වූ බවට අප එකඟ වේ. | ප්‍රමාද ගාස්තු සහ බැඳීම් ගාස්තු වළක්වා ගැනීම සඳහා පියවීම් පටිපාටිය කඩිනම් කිරීම. |
| ඕ | ජල හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජල හා සනීපාරක්ෂක අංශයේ අත්පොතෙහි ඇතුළත් විස්තීර්ණ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමට අනුව, ජල සම්පාදන හා | මොනරාගල ප්‍රතීක පවිත්‍රාගාර ඉදිකිරීම 2020 දී ආරම්භ විය. මේ වන විට එය ක්‍රියාත්මක කිරීමේ අදියරේ පවතී. කෙසේ වෙතත්, සනීපාරක්ෂක ප්‍රධාන සැලැස්ම සහ මාර්ග සිතියම 2021 ඔක්තෝම්බර් 19 වැනි දින හඳුන්වා දී ඇත. එම නිසා, | ව්‍යාපෘතිය විසින් 2020-2030 ජාතික සැලැස්ම සඳහා අවශ්‍යතා හඳුනාගෙන තිබුණි. එම නිසා, ජාතික සැලැස්මට පටහැනිව මෙම ප්‍රතීක |

| | | | |
|---|---|---|---|
| | සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් ව්‍යුත්පන්න වූ මූලාශ්‍රය ප්‍රකාරව 2020-2030 කාලසීමාව තුළ මොණරාගල, කිලිනොච්චි සහ මුලතිව් සඳහා ප්‍රතික පවිත්‍රාගර අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, එම දිස්ත්‍රික්කවල ප්‍රතික පවිත්‍රාගාර සඳහා ව්‍යාපෘතිය රු. මිලියන 345.53 ක් ආයෝජනය කර තිබූ අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නිම කරන ලද ප්‍රතික පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය නිම නොකිරීම හේතුවෙන් 2023 පෙබරවාරි මාසයේ සිට එය ක්‍රියාත්මක නොවීය. | සනීපාරක්ෂක ප්‍රධාන සැලැස්ම හඳුන්වා දීමට පෙර අදාළ පළාත් පාලන ආයතනවල ඉල්ලීම් මත සහ මෙම නාගරික ප්‍රදේශවල මළ අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීමේ ඉල්ලීම් තක්සේරු කිරීමෙන් පසු එම ප්‍රතික පවිත්‍රාගාර ව්‍යාපෘති තුන ආරම්භ කර ඇත.<br><br>කිලිනොච්චි ප්‍රතික පවිත්‍රාගාර සඳහා ප්‍රවේශ මාර්ගය සම්පාදනය කිරීමේ අදියරේ පවතී; සම්පාදනය කරන අතරතුර, ප්‍රතික පවිත්‍රාගාර වෙත මල අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට තාවකාලික ප්‍රවේශ මාර්ගයක් සදා ඇත. | පවිත්‍රාගාර සංවර්ධනය වූයේ කෙසේද යන්න සොයා බැලිය යුතුය. |
| ක | ව්‍යාපෘතියේ කාලසීමාව තුළ දිස්ත්‍රික්ක 07 තුළ ඉදිකිරීමට නියමිත වැසිකිළි 24,000, වැසිකිළි 22,000 ක් ලෙස වෙනස් කරන ලද අතර එයින් වැසිකිළි 21,944 ක් හෙවත් සියයට 91 ක් පමණක් නිම කර තිබුණි. ව්‍යාපෘති කාලසීමාව අවසානයේදී සැලසුම් කරන ලද ගෘහස්ථ වතු සනීපාරක්ෂක ඒකක 3,000 අතරින් ඒකක 2,390 ක් හෙවත් සියයට 79 ක් පමණක් නිම කර තිබුණු අතර සැලසුම් කරන ලද ආයතනික සනීපාරක්ෂක ඒකක 14 අතරින් ඒකක 07 ක් හෙවත් සියයට 50 ක් පමණක් නිම කර තිබුණි. | පදිංචිය අතහැර දැමීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ඉහළ මිල උච්චාවචනයන් හේතුවෙන් සැලසුම් කළ ඉලක්කයෙන් තනි වැසිකිළි ප්‍රතිලාභීන් 56 දෙනෙකු පමණක් ඉවත් වී ඇත. වතු උප ව්‍යාපෘතිවල, ව්‍යාපෘති අරමුදල් නිදහස් නොකිරීම, ද්‍රව්‍යවල අධික පිරිවැය සහ දරිද්‍රතා රේඛාවට යටින් සිටි සමහර ප්‍රතිලාභීන් හේතුවෙන් ගෘහාශ්‍රිතයින් 547 දෙනෙකු ඉවත් වී ඇත. ඉදිකිරීම් ද්‍රව්‍යවල ඉහළ මිල උච්චාවචනය හේතුවෙන් ආයතනික සනීපාරක්ෂක ඒකකවල ඒකක 4 ක් පමණක් ඉවත් වී ඇත. | අනවශ්‍ය පිරිවැය මඟහරවා ගැනීම සඳහා මූලික අදියරේදී සැබෑ අවශ්‍යතාවය තක්සේරු කිරීමෙන් පසු ළඟා කරගත හැකි ඉලක්කයක් ස්ථාපිත කළ යුතුය. |
| ග | ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරී සැලැස්මට අනුව, කෑගල්ල, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රු. 250,000 බැගින් වූ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන්ගේ සනීපාරක්ෂක ඒකක 84 ක් ඉදිකිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය අවසන් වන විට කෑගල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල ඒකක 48 ක් හෙවත් සියයට 57 ක් පමණක් ඉදිකර තිබුණු අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. | මුලදී, කිලිනොච්චිය සහ මුල්තිව් දිස්ත්‍රික්කවල ද විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේදී, සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය ද එම ප්‍රතිලාභීන් හඳුනාගෙන ඇති බව ව්‍යාපෘතියට දැන ගැනීමට ලැබී ඇත. එබැවින්, එලෙස හඳුනාගත් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් ව්‍යාපෘතියෙන් ඉවත් කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර ඇත. | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීමේදී අවශ්‍යතා තක්සේරු කිරීම සිදු කළ යුතුය. |
| ච | කොන්ත්‍රාත්කරුවන්ට කාලය දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දීමෙන් පසුවත් සහ ව්‍යාපෘති කාලයෙන් මාස 03 ඉක්මවා ඇතත් මෙම ව්‍යාපෘතිය නාගරික කාණ්ඩය - 02 සහ ග්‍රාමීය හා වතු කාණ්ඩයේ සැලසුම් කළ ජල සම්බන්ධතා 61,925 අතරින් සම්බන්ධතා 49,423 ක් හෙවත් සියයට 80 ක් පමණක් | ග්‍රාමීය සහ වතු යන දෙඅංශයේම නිවාස සම්බන්ධතා ඉලක්කය 73,682 ක් විය. 2024 මැයි 31 වන දිනට නිවාස සම්බන්ධතා ප්‍රගතිය 62,767 ක් හෙවත් සියයට 85 ක් විය. නාගරික ජල සම්පාදන ව්‍යාපෘතියේ නිවාස සම්බන්ධතා ඉලක්කය 21,702 ක් වන අතර 2024 මැයි 31 වන | අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා ළඟා කරගත හැකි ඉලක්ක මූලික අදියරේදීම ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබා දී තිබුණු අතර නාගරික කාණ්ඩය - 01 හි සැලසුම් කළ ජල සම්බන්ධතා 21,702 අතරින් සම්බන්ධතා 15,051 ක් හෙවත් සියයට 69 ක් ලබා දී තිබුණි. | දින දක්වා ප්‍රගතිය 15,358 ක් හෙවත් සියයට 71 ක් විය. ග්‍රාමීය හා වතු ජල සම්පාදන යෝජනා ක්‍රමවල නිවාස සම්බන්ධතා ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ප්‍ර.මූ.ස/ඊ.ඩබ්ලිව්.එච්.සී.එස් සමඟ එක්ව කටයුතු කරයි. ඊට අමතරව, මණ්ඩලය විසින් ජංගම සේවා පවත්වයි. | |

### 3.3 වාරක පරීක්ෂණ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අ | උඩුගොඩ සහ කොටියාකුඹුර ප්‍රදේශයේ ප්‍ර.මූ.ස 195 ක ජල සාම්පල පරීක්ෂා කිරීම සඳහා ඉදිකරන ලද රු. මිලියන 8 ක වටිනාකමකින් යුත් රසායනාගාර දෙකක් භෞතික පරීක්‍ෂණයට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක නොවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් ප්‍ර.මූ.ස වරින් වර ගුණාත්මකභාවය පරීක්ෂා නොකර ජලය බෙදාහරියි. | සියලුම රසායනාගාර උපකරණ මණ්ඩලය වෙත භාර දී ඇත. | 2024 ජූනි 30 දින දක්වා සම්පූර්ණයෙන්ම භාර දී නැත. එම නිෂ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| ආ | විගණන පරීක්‍ෂණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති 13 ක් අතරින් 04 කම පිරිපහදු කළ ජල සහ පිරිපහදු නොකළ ජල සාම්පල යන දෙකෙහිම ජල පරීක්‍ෂණවල ප්‍රතිඵල අසමත් විය. | ජල සාම්පල පරීක්ෂණ වාර්තා මත පදනම්ව, එස්.එල්.එස් ප්‍රමිතිය තුළ පානීය ජලය වැඩිදියුණු කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය විසින් ප්‍ර.මූ.ස වෙත අඛණ්ඩව දැනුවත් කරයි. | හේතු සොයා බලා පිරිසිදු ජලය බෙදා හැරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| අ | 2019 මාර්තු 15 දිනැති චක්‍රලේඛ අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අවශ්‍යතාවයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ඉංජිනේරු, කළමනාකරණ සහකාර, කාර්යාල සහකාර, ජල භූ විද්‍යා, ඉංජිනේරු සහකාර (සිවිල්), සංවර්ධන සහකාර සහ ගිණුම් සහකාර යන තනතුරු සඳහා ව්‍යාපෘතිය සේවකයින් 17 දෙනෙකු යොදවා තිබුණි. | නියමිත කාල සීමාවට අනුව ව්‍යාපෘතිය අවසන් කළ යුතුය. නමුත් රජය නව පත්වීම් සීමා කර ඇත. ව්‍යාපෘති ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කෙටි කාලීන සේවා කොන්ත්‍රාත්තු මගින් අවශ්‍ය කාර්ය මණ්ඩලය කුලියට ගෙන ඇත. | චක්‍රලේඛවල විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම. |

| | | | |
|---|---|---|---|
| ආ | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 05 දිනැති චක්‍රලේඛ අංක 01/2019 හි 2.3.2 වගන්තියට අනුව ඵලදායි ව්‍යාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සෑම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතු වුවත් 2020 නොවැම්බර් 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර උතුර) ලෙස උසස් කර ඇත. | නව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට ලෝක බැංකුවෙන් සහ අමාත්‍යාංශයෙන් අවශ්‍යතාවයක් ලැබී නොතිබුණි. | එකී චක්‍රලේඛයෙන් දක්වා ඇති උපදෙස් අනුව පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |